# තායිලන්තය (සියම) හා ශ්‍රී ලංකාව අතර පැවති සංස්කෘතික සබඳතා පිළිබඳ ඓතිහාසික විමසුමක්

කලුන්දෑවේ චන්දවිමල හිමි

## හැඳින්වීම

තායිලන්තය හා ශ්‍රී ලංකාව ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය මත ගොඩනැගුණු රාජ්‍යයන් දෙකක් වන අතර එනිසා ම එම රාජ්‍යයන් දෙක අතර ගොඩනැගුණු සබඳතාවන්ට සංස්කෘතික ක්ෂේත්‍රයේදී සුවිශේෂිත බවක් හිමි වී තිබේ. සංස්කෘතික සබඳතාවන්ට අමතරව මානව කණ්ඩායම්හි හුවමාරුව මත ද දෙරටේ සබඳතා වඩාත් ශක්ති මත් වී තිබේ. දෙරටේ සබඳතාවන්හි වස්තු බීජය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය මත ගොඩනැගී ඇති බැවින් එම සබඳතාවන්හි ඉතිහාසය ද ඈත අව ධියට ගමන් කරයි. සියම හා ශ්‍රී ලංකාව අතර ගොඩගැගෙන සංස්කෘ තික හා මානව හුවමාරුවීම් නිසා දෙරටේ ම ඒ ඒ ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන සංවර්ධනයක් මෙන් ම ස්ථාවර බවක් ද ඇති වී තිබේ. එම ස්ථාවර බව තත් රාජ්‍යයන්හි ඉතිහාසයේ විවිධ අංශ ශක්තිමත් කිරීම ට ද සමත්ව ඇත. ඒ අනුව මෙම ලිපිය තුළින් දෙරට අතර ගොඩනැ ගුණු සංස්කෘතික සබඳතාවන්හි ඉතිහාසය, එම සබඳතාවන්හි ස්වරූ පය හා දෙරට අතර හුවමාරු වූ මානව කණ්ඩායම් හා සංස්කෘති කාංග කවරේද යන්න අධ්‍යයනය කෙරේ.

### ❖ දෙරට අතර පැවති සංස්කෘතික සබඳතා හා ඒවායේ ඓතිහාසික පසුබිම

සියමත් ශ්‍රී ලංකාවත් අතර ගොඩනැගුණු සබඳතාවේ ඉතිහා සය ක්‍රි. ව. හත්වන සියවස තරම් ඈත අවධියකට ගමන් කරන බව ඇතැම් ඉතිහාසඥයන්ගේ අදහස වී තිබේ. ක්‍රි. ව. හත්වන සියවසේ සිට ක්‍රි. ව. එකොළොස්වන සියවස පමණ තෙක් තායිලන්තයේ පැව තියේ යැයි අනුමාන කරන ද්වාරවතී රාජ්‍යයේ මධ්‍යම සියමෙන් හා ඊශානදිග සියමෙන් හමු වූ ලෝකඩ බුදුපිළිම එයට නිදසුන් ලෙස

ඔවුහු පෙන්වා දෙති. එම බුදුපිළිම අනුරාධපුර යුගයේ ඒ අවධියේ බුදුපිළිමවල දක්නට ලැබෙන අභය මුද්‍රාව, සිවුරු පාරුපනය, කර්කටක මුද්‍රාව යන ලක්‍ෂණවලින් යුක්ත වෙයි.[1] එම පිළිම දකුණු ඉන්දියාවේ අමරාවතී හා ශ්‍රී ලංකාවේ අනුරාධපුරයත් ආශ්‍රිතව දියුණු වූ සම්ප්‍රදායේ ආභාසය මත නිමවන්නට ඇතැයි යනුවෙන් ද ඔවුහු අදහස් කරති.[2] ක්‍රි. ව. දහසයවන සියවසට පමණ අයත් වේයැයි සැල කෙන තායි වංසකථාවක් වන **ජිනකාලමාලියේ** එන විස්තරයකට අනුව ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර සබඳතා ආරම්භ වනුයේ ක්‍රි. ව. දහතුන්වන සියවසේ දී පමණ සිටය.[3] එහි එන විස්තරයට අනුව මේ සම්බන්ධයට මුල් වූයේ 'සීහලපටිමා හෙවත් සිහිංගවර පටිමා' නම් ආශ්චර්යමත් පිළිමයක් පදනම් කරගෙනය. එය අයත්ව තිබුණේ සිංහල රජවරුන්ටය. මෙම කරුණ ඒ ආකාරයෙන් ම පිළිගැනීමට ඉතිහාසඥයෝ මැලි වෙන අතර **ජිනකාලමාලියේ** එන මෙම කරුණු විශ්වසනීයත්වයෙන් තොර බව ද පෙන්වා දෙති.[4] කෙසේ නමුදු මෙම විස්තරයන්ට අනුව අනුරාධපුර රාජධානියේ මධ්‍ය කාලයේ සිට ම තායිලන්තය; ශ්‍රී ලංකාව සමඟ සබඳතා ගොඩ නගාගත් බවත් ශ්‍රී ලංකාවේ සංස්කෘතික ආභාසය තත් අවධියේ සිට ම තායිලන්තයට ලැබී ඇති බවත් මෙයින් පැහැදිලි වෙයි. මෙම පිළිම ඉන්දියාවේ අමරාවති හෝ ගුප්ත සම්ප්‍රදාය හෝ සිංහල සම්ප්‍රදාය නියෝජනය කරන බව Reginald Le May (රෙජිනල්ඩ් ලි මෙ) ද පෙන්වා දෙයි.[5] සුඛෝතායිහි ඇති නිර්මාණ සඳහා සිංහල දේශයේ බලපෑම හොඳින් ලැබී ඇති බව ඔහු විසින් තර්කානුකූලව පෙන්වා දී තිබේ.

අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ ඉතා හොඳින් ජනප්‍රියව පැවති ශ්‍රී මහා බෝධි වන්දනාව, ශ්‍රී පාද ලාංඡනය වැනි වන්දනා ක්‍රම මෙන්ම ත්‍රිපිටක හා අටුවා වැනි ධර්ම ග්‍රන්ථ ද ක්‍රි. ව. හත්වන සියවස තරම් කාලයකදී ද්වාරවතී රාජ්‍යයේ ජනප්‍රියව පැවති බව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් තහවුරු වෙයි. වර්තමාන තායිලන්තයේ අගනුවර වන බැංකොක් නුවරට කි. මී. 150ක් පමණ දුරින් පිහිටි 'ප්‍රාචීන්බූරි' නමැති ස්ථානයේ ශ්‍රී ලංකාවෙන් ගෙන ගිය ශ්‍රී මහා බෝධි අංකුරයකින් වැඩුණු විශාල බෝරුකක් ඇත. එය නැගෙනහිර තායිලන්තයේ බෞද්ධ සංස්කෘතියේ විශේෂ කේන්ද්‍රීය සංකේතයක් ලෙස සැළකේ. එම බෝධීන් වහන්සේ පිහිටි ප්‍රදේශය ''ඩොන්සීමාබෝ'' (ශ්‍රී මහා



බෝධි අඩවිය) යන නමින් හැඳින්වේ.[6] මේ විස්තරයෙන් පැහැදිලි වනුයේ සියමේ ද්වාරවතී ශිෂ්ටාචාරය පැවති අවධියේ ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාද ගණනාවක් තායිලන්තය ලබාගෙන ඇති බවය. මෙරට වන්දනීයත්වයට පාත්‍ර වූ පූජනීය වස්තු තායිලන්තය තුළ ද එකසේ ජනප්‍රිය වීමෙන් පැහැදිලි වනුයේ මෙරට සමඟ සමීප වශයෙන් සංස්කෘතික සබඳතා ගොඩනගාගෙන ඇති බවය. එසේ සමීප සබඳතා පැවැත්වීමට ප්‍රධාන හේතුව වනුයේ දෙරට ම ථේරවාදී සම්ප්‍රදාය ගරු කරන රාජ්‍යයන් දෙකක් වශයෙන් පැවතීම යැයි විශ්වාස කළ හැකිය.

මෙම ආගමික සබඳතාවන්ට අමතරව භාෂාමය දැනුම හා මෙරට ජනප්‍රිය කථා පුවත් ද්වාරවතී රාජ්‍යය තුළ ප්‍රසිද්ධව පැවති බව අභිලේඛන මූලාශ්‍රවලින් පැහැදිලි වෙයි. ශකවර්ෂ 683 හෙවත් ක්‍රි. ව. 761 පිහිටුවන ලද පුවරු ලිපියක ශ්‍රී ලංකාවේ රචිත **තේලකටාහ ගාථා** නම් පාළි කාව්‍යයේ ත්‍රිවිධ රත්නයට කරන ලද නමස්කාර ගාථා තුන අන්තර්ගතවූ තිබේ. මෙම තේලකටාහ ගාථා කැලණියේ කැලණිතිස්ස රජතුමාගේ කාලයේ සිදු වූ පුවතක් වන අතර එම සිදු වීම පාදක කරගෙන මෙරට තේලකටාහ ගාථා නමින් පාළි කාව්‍යයක් ලියවුණි.[7] එහි එන මේ නමස්කාර ගාථා තායිලන්තයේ ප්‍රාචීන්බූරි ස්ථානයේ තිබුණු සෙල්ලිපියකින් හමුවීම තුළින් පෙන්නුම් කරනුයේ අනුරාධපුරයේ සිට තායිලන්තයට වැඩම කළ මෙරට භික්ෂූන් වහන්සේලා පිරිසක් විසින් තත් ග්‍රන්ථය ද රැගෙන යන්නට ඇති බවය. එසේම ශ්‍රී ලංකාවෙන්-වැඩිය භික්ෂූන් වහන්සේලා මේ ස්ථානයේ වාසය කරන්නට ඇති බවට ද මෙයින් විශ්වාස කළ හැකිය. මෙම සෙල්ලිපියේ 'වර පාද ප්‍රතිෂ්ඨා' යන සඳහනක් ද අන්තර්ගතව පවතී. ඒ අනුව ඒ ස්ථානයේ කරන ලද කැණීමකදී පාද ලාංඡන දෙකක් සොයාගෙන තිබේ. ඒවා ආවරණය කර බිත්ති බැඳ තිබූ අතර එහි චෛතියඝරයක් තිබෙන්නට ඇතැයි තායි පුරාවිද්‍යාඥයෝ කල්පනා කරති.[8] මෙවැනිම ශ්‍රී පාද ලාංඡන පිහිටුවීමක් හා ඒ වටා චෛතියඝර පිහිටුවීමක් අනුරාධපුර ථූපාරාමයට නැගෙනහිර ප්‍රදේශයෙන් සොයාගෙන තිබේ. ප්‍රාචීන්බූරි පාද ලාංඡන පිහිටුවීම අනුරාධපුර පාද ලාංඡන පිහිටුවීමේ අනුකරණයෙන් පිහිටුවන්නට ඇතැයි ඇතැම් තායි පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති.[9] මෙම විස්තරයන්ට අනුව යටත් පිරිසෙන් ක්‍රි. ව. හත්වන සිය

වසේ සිට ක්‍රි. ව. එකොළොස්වන සියවස දක්වාවත් තායිලන්තයේ ද්වාරවතී ශිෂ්ටාචාරය සමඟ අනුරාධපුර ශිෂ්ටාචාරය සමීප සංස්කෘතික සබඳතා පවත්වන්නට ඇති බව මෙයින් පැහැදිලි වෙයි.

පොළොන්නරුව අවධියේදී ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර සංස්කෘතික සබඳතා පැවති බවට නිදසුන් හමුවේ. පොළොන්නරුවේ ඉදි වූ කලා නිර්මාණ අතර නිශ්ශංකමල්ල රජතුමාගේ අවධියේ ඉදි වූ සත්මහල් ප්‍රාසාදය මීට පෙර ශ්‍රී ලංකාවේ දී දක්නට නොලැබුණු නිර්මාණයකි. එම නිර්මාණයට ආභාසය වන්නට ඇත්තේ සියමේ 'ලම්පූන්' නගරයේ "වත් කුකුත්" (කුක්කුටාරාමය) නමැති විහාරස්ථානය වන්නට ඇතැයි යන්න ඇතැමුන්ගේ අදහස වී තිබේ. මීට සමාන ගොඩනැඟිලි තායිලන්තයේ ඇතුළු අග්නිදිග ආසියානු රටවල් කීපයකම අදටත් දැකිය හැකිය.[10] මේ අවධියේදී සියමත් ශ්‍රී ලංකාවත් අතර වාස්තු විද්‍යාත්මක සබඳතා ගොඩ නැඟෙන්නට ඇතැයි මෙයින් කල්පනා කළ හැකිය.

ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර ගොඩනැගුණු සංස්කෘතික සබඳතාවල වැදගත් අවස්ථාවක් 'සිරිධම්ම' නගරය හා කේන්ද්‍ර කරගෙන පවතී. දකුණු තායිලන්තයේ ශ්‍රී ධර්මරාජ අගනුවර හා සම්බන්ධ ඉතිහාසය අනාවරණය කරන **රත්නවාලුකා වංසයට** අනුව සිරිධම්ම නගරය පිහිටා තිබුණේ හේමමාලා හා දන්තකුමරු ශ්‍රී ලංකාවට යද්දී කලක් නතර වී සිටි තැනය. (මෙම සිදුවීම් ඇතැම් විටෙක අතිශයෝක්තියෙන් යුක්ත වෙයි.) මෙම නගරය මලය අර්ධද්වීපයේ කුඩා ගොඩබිම් තීරුවේ පිහිටා තිබේ. මෙහි ඇති වූ සාගත අවස්ථාවකදී රජතුමා හා ජනතාව නගරය හැර දමා නැගෙනහිර ප්‍රදේශයට යන විට වැලි තලාවකට පැමිණියහ. එහි අලුත් නගරයක් නිර්මාණය කිරීමට බමුණන් හතර දෙනෙකු සැලැස්මක් හදා දුන්හ. එහිදී රජු එම නගර සැලැස්මට අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවට දූතයන් පිරිසක් එවා තිබේ. සිංහල රජු අතිශයින් සතුටුව එම සැලැස්ම අනුමත කොට නව නගරයේ ආගමික කටයුතු කිරීම සඳහා 'ධම්මගම්භීර' නමැති සිංහල මහ තෙරවරයකු සමඟ එම දූත පිරිස එහි යවා ඇත. නගරය ගොඩනැගීමේ දී එහි පාලකයා සිංහල භික්ෂුවගෙන් අවවාද අනුශාසනා ලබාගෙන තිබේ. මෙම සිදුවීමේ කිසියම් සත්‍යයක් තිබිය හැකිය. එය සත්‍යයක් නම් තායිලන්තයේ ආගමික කටයුතු කිරීම



සඳහා මෙන්ම ගෘහ නිර්මාණ ශිල්පයටත් නගර නිර්මාණයටත් ශ්‍රී ලංකාවෙන් ආභාසය ලැබී ඇති බව තීරණය කළ හැකිය. ශ්‍රී ලංකාවත් තායිලන්තයත් අතර ප්‍රථම වරට ඍජු සබඳතා ඇති වනුයේ සිරිධම්ම නගරය කේන්ද්‍ර කරගෙන බව පසුකාලීනව ලියවී තිබෙන වංසකථාවලින් හෙළි වෙයි.

ක්‍රි. ව. 1260 ගණන්වලදී ශ්‍රී ලංකාවත් තායිලන්තයත් අතර සබඳතා ගොඩනැගෙන්නේ බුද්ධ ප්‍රතිමාවක් මූලික කරගෙනය. සිරිධම්ම නගරයට වැඩම කළ අසිරිමත් බුදුපිළිමයක් පිළිබඳව **සිහිංගවර බුද්ධ නිදානය** හෙවත් (උතුම් සිංහල බුදුපිළිමයේ නිදාන කථාව) මෙන්ම **ජිනකාලමාලි** ග්‍රන්ථයේ ද සඳහන් වෙයි.[11] මෙහි සඳහන්වන තොරතුරුවලට අනුව සියමේ සුඛෝදයේ රජු (සුඛෝදයේ ආරම්භක ඉන්ද්‍රාදිත්‍ය රජු හෝ ඔහුගේ මුනුබුරු 'රාම් කම්හෙං' රජු විය හැකිය) සිරිධම්ම නගරයේ රජු සමඟ කතිකා කරගෙන ශ්‍රී ලංකාවේ ඇතැයි කියන අසිරිමත් බුදුපිළිමය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට දූතයන් එවා තිබේ. මේ අසිරිමත් බුදුපිළිමය බු. ව. 700දී එනම් ක්‍රි. ව. 158 දී පමණ රජවරුන් තිදෙනෙකු පාලනය කරද්දී එක් කෙනෙකු රහතන් වහන්සේලාගේ අනුශාසනා මත නිර්මාණය කළ ලෝකඩ පිළිමයකැයි විශ්වාස කෙරේ. මෙය ශ්‍රී ලංකාවේදී මහත් පුදපූජාවන්ට ලක්ව ඇති අතර එය ලබා ගැනීම සඳහා ක්‍රි. ව. 1256 දී ඉහත දූත පිරිස ශ්‍රී ලංකාවට පැමිණි බව සඳහන් වේ. එම පිළිම වහන්සේ සියමට වැඩම කරවීමේ කථා පුවත ආශ්චර්යමත් සිදුවීම්වලින් ගහණය. **ජිනකාලමාලියේ** එම කථා පුවත අතිශයෝක්තියෙන් සඳහන් කර ඇති අතර එහි එන විස්තරයට අනුව පැහැදිලි වනුයේ 'රෝච' රජු එය සිරිධම්ම නුවර සිට සුඛෝදයට වඩමවාගෙන ගිය බව ය.[12] එම බුදුපිළිමය සුඛෝදයට වැඩම කර වීමෙන් පසුව වසර 700ක් පමණ සියම් රජවරුන්ගේ රාජ්‍ය බලයේ සංකේතයක් ලෙස සම්මානයට පාත්‍ර විය.[13] මෙරට පාලකයෙකු සතුව දළදා වහන්සේ පවතී නම් ඔහු මෙරට රාජ්‍යයට උරුමකම් කියන බව මෙරට පාලකයන් හා සාමාන්‍ය ජනයා තුළ විශ්වාසයක් තිබූ[14] අතර එම විශ්වාසය ඒ ආකාරයෙන් ම සියම තුළ ද ජනප්‍රිය වූ බව මෙයින් පැහැදිලි වෙයි. මෙරට රජවරුන් දළදා වහන්සේ තමන් සන්තක කර ගැනීම සඳහා යම්සේ ගැටුම්වලට[15] මැදිහත් වූයේ ද ඒ ආකාරයෙන් ම සිංහල බුදුපිළිමය ලබා ගැනීම

සඳහා සියම් පාලකයන් අතර වරින්වර අර්බුද හා ගැටුම් ඇති වී තිබේ.[16] මෙම විශ්වාසයන් සමකාලීන සමාජ සංස්ථා දෙකේදී ම දක්නට ලැබීමෙන් පැහැදිලි වන කරුණ වනුයේ දෙරට අතර සිදු වූ සංස්කෘතික මුසුවීම්වල ස්වභාවය කවරේද යන්නයි. එම ස්වර්ණා ලේපිත බුදුපිළිමය වර්තමානයේ බැංකොක් නුවර කෞතුකාගාරයේ ''සිහිංග බුද්ධ ශාලා'' නමැති සුවිශේෂිත කුටියක තැන්පත් කර තිබේ.[17] එම බුද්ධ ප්‍රතිමාව සෑම වසරකම අප්‍රේල් මාසයේ දාහත රවනදා එයින් එළියට වඩමවා පෙරහැරින් නුවර ප්‍රදක්ෂිණා කොට කෞතුකාගාරය ඉදිරිපස ඇති 'සනාම්ලුවාන්' නමැති පිට්ටනියේ කූඨා ගාරයක තැන්පත් කෙරේ. තායි බෞද්ධ ජනතාව එයට වන්දනාමාන කරන අතර එයින් පසුව නැවතත් කෞතුකාගාරයේ තැන්පත් කරයි. ඒ වෙනුවෙන් විශේෂ පූජා චාරිත්‍ර සමුදායක් පවතී.[18] මෙම පූජා චාරිත්‍රය ශ්‍රී ලංකාවේ පවත්නා දළදා වහන්සේ වෙනුවෙන් කරනු ලබන පූජා චාරිත්‍රයන්ට සමානකමක් දරයි.[19] සිංහල බුද්ධ ප්‍රතිමාව සම්බන්ධයෙන් ගොඩනැඟී තිබෙන චාරිත්‍ර විධි සියල්ල ම පාහේ දළදා වහන්සේ වෙනුවෙන් මෙරට පැවති චාරිත්‍ර ක්‍රමවේද, විශ්වාස යන් හා සමාන වන හෙයින් මෙරටින් තත් ආභාසය සියම් වැසියන් ලබා ගන්නට ඇතැයි කල්පනා කළ හැකිය.

මෙම කථා පුවත් හා සැසඳෙන විස්තර **මහාංවසෙයේ** හා **පූජාවලියේ** සඳහන්ව තිබේ. දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජ සමයේ (ක්‍රි. ව. 1236 - 1271) 'තම්බලිංග' දේශයෙන් හෙවත් තමලිංග මුවෙන් පැමිණි චන්ද්‍රභානු නම් ජාවක රජකු දෙවරක් ම ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ බව සඳහන් වෙයි.[20] ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ මේ චන්ද්‍රභානු රජු **සිහිංගවර බුද්ධ නිදානයේ** ද **ජිනකාලමාලියේ** ද සඳහන්වන සුඛෝදයේ රජු හා සිරිධම්ම රජු අසිරිමත් පිළිමය ලබා ගනු සඳහා ශ්‍රී ලංකාවට එවූ දූතයා විය හැකි බව බොහෝ ඉතිහාස ඥයන්ගේ අදහස වී තිබේ. එම දූතයාට නම් දෙවන පරාක්‍රමබාහු රජ තුමා බුදුපිළිමය පරිත්‍යාග කළ බවක් මූලාශ්‍රවල සඳහන් වන්නේ නැත. නමුත් තත් අවධියේ 'තමලිංගමුවේ ධම්මකිත්ති' නම් මහතෙර නමක් පිඬු පිණිස වඩනා කල්හි පෙරමඟ පියුම් පැන නැංගේයැයි අසා දෙවන පරාක්‍රමබාහු රජතුමා දහම් පඬුරු හා රජ පඬුරු යවා උන්වහන්සේ මෙහි වැඩමවා උන්වහන්සේ යටතේ පළාබත්ගල සුවි



ශේෂී වූ වනවාසී භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් පිහිටු වූ බව **මහාවංස යේ** හා **පූජාවලියේ** සඳහන් වෙයි.[21] මෙම කථා සිද්ධියට අනුව මෙරටින් අසිරිමත් බුදුපිළිමයත්, එරටින් ධම්මකිත්ති හිමියනුත් දෙපි රිස හුවමාරු කරගන්නට ඇතැයි කල්පනා කළ හැකිය. අසිරිමත් බුදු පිළිමය සුඛෝදයට වැඩමෙවූ 'රාම්කම්හෙං' රජු සුඛෝදය රාජ්‍යය තායිලන්තයේ ප්‍රබල බෞද්ධ රාජ්‍යය බවට පත් කළේය. එතුමා විසින් එම නගරයේ පිහිටුවන ලද සෙල්ලිපියකට අනුව ශ්‍රී ලංකාවෙන් වැඩම කළ සිංහල මහාසාමි සංඝරාජ කෙනෙකු එතුමාගේ අනුග්‍රහ යෙන් සියමේ සුඛෝදය ප්‍රදේශයේ සිංහල බුදු සමය පැතිර වීය.[22] මෙම උපසම්පදා විනය කර්මයත් සමඟ ස්ථිර වශයෙන් ම සියමේ සිංහල සංඝ ශාසනයේ පිහිටීම සිදු විය. සියම තුළ සිංහල සංඝ ශාසනය පිහිට වූ ආකාරය පිළිබඳ දිගු විස්තරයක් **ජිනකාලමාලියේ** සඳහන් වෙයි.[23] එම ක්‍රියාවලිය තුළින් සියමේ සිංහල සංඝ ශාසනය නමින් නව භික්ෂු නිකායක් ඇති විය. මෙවැනි අතිශයින් සමීප වූ සංස්කෘතික සබඳතාවක් දඹදෙණිය අවධියේ දී තායිලන්තයත් ශ්‍රී ලංකාවත් අතර තිබුණු බව ඉහත තොරතුරුවලින් ගම්‍ය වෙයි.

ක්‍රි. ව. දාහතරවන සියවසේ සුඛෝදය රාජ්‍යයේ පාලකයා වූ 'ලූ තායි' රජුගේ කාලයේදී (ක්‍රි. ව. 1317 - 1347) ශ්‍රී ලංකාව හා සියම අතර ආගමික සම්බන්ධතා වර්ධනය විය. මේ රජු සමන්තකූටයේ ශ්‍රී පාදය අනුකරණය කරමින් තම රාජ්‍යයේද බුද්ධපාද රාශියක් කළ බවට තොරතුරු හමුවේ.[24] ඔහුගේ රාජ්‍ය කාලයේ තායි රජ පවුලට අයත් කුමාරයෙක් පැවිදි වී ඉන්දියාවෙන් මෙන් ම ශ්‍රී ලංකාවෙන්ද ධාතුන් වහන්සේලා රැසක් රැගෙන සියමට වැඩිය බව වාර්තා වේ.[25] සුඛෝදයේ ඇති 'වත්මහතත්' විහාරය ශ්‍රී ලංකාවේ සංස්කෘතික ආභා සය පෙන්නුම් කෙරෙන කැඩපතක් වැනිය. රෙජිනෝල්ඩ්ගේ අදහසක් උපුටා දක්වන ඉලංගසිංහයන් පෙන්වා දෙනුයේ සිංහල බුදුදහම තායි ජනතාවගේ ආගම කෙරෙහි ඇති කළ බලපෑමේ උපත පිළිබඳව මේ සුඛෝතායි නිර්මාණ අගනා නිදසුන් බවය.[26] ''මෙය නියම කොට ඇති ආකාරයේ අභ්‍යන්තර හැඟීම් නිසැකයෙන් ම තායි වූවත්, ක්‍රි. ව. පස්වන සියවසට අයත් සීගිරි අප්සරාවගේ හා පරිවාර ස්ත්‍රියකගේ රූපද සමඟ සංසන්දනය කළ විට ඊට වඩා මැත දී එම දිවයිනේ පොළොන්නරුවේ ඇති, දෙළොස්වන සියවසට අයත් රූපද සමඟ